වාර්ෂික වාර්තාව

2012

සී/ස.කොළඹ කොමර්ෂල් පොහොර සමාගම .

දැක්ම

“කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා

නොපමාව නිෂ්පාදනය කොට බෙදාහැරීමෙන්

ශ්‍රී ලාංකීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයට ධනාත්මකව දායකත්වය සැපයීම තුළින්

රාජ්‍ය අංශය සතු ආදර්ශමත් ආයතනයක් වශයෙන් ක්‍රියාකිරීම”.

මෙහෙවර

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම පොහොර නිෂ්පාදකයා හා බෙදාහරින්නා බවට පත්ව

රජයේ කෘෂි කර්මාන්තය සඳහා වූ දැක්මේ සාඩම්බර හිමිකරුවකු වී

නිෂ්පාදන විවිධාංගීකරණය කරමින්,

උසස් තත්වයේ නිෂ්පාදන එළිදක්වමින්,

සහ ආයතනයේ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා අනුව කටයුතු කරමින්,

ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාකිරීම සඳහා අවස්ථාව උදාකර ගැනීම.


COLOMBO COMMERCIALFERTILIZERS LTD
DISTRIBUTION NETWORK
Northern
Sippukulama
Kanthale
Pandulagama
Serunuwara
Negampaha
North Central
Galenbindunuwa
Jayanthipura
Kaduruwela
North Western
Nikaweratiya
Kurunegala
Eastern
Central
Kadugannawa
Akkareipattu
Badulla
HEAD OFFICE & CENTRAL WAREHOUSEHUN UPITIYA
Western
Uva
Buttala
Sabaragamuwa
Suriyaara
Bataatha
Southern
Matara

පටුන

✸	සංස්ථා තොරතුරු	01
✸	සභාපතිතුමාගේ සමාලෝචනය	02 - 04
✸	විගණකාධිපති වාර්තාව	05 - 11
✸	ශේෂ පත්‍රය	12
✸	ආදායම් ප්‍රකාශය	13
✸	ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීමේ ප්‍රකාශය	14
✸	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	15
✸	ගිණුම්කරණ ප්‍රතිපත්ති	16 - 21
✸	ගිණුම්වලට සටහන්	22 - 32

<u>සංස්ථා තොරතුරු</u>

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම වර්ෂ 1872 මහා බ්‍රිතාන්‍යයේ සංස්ථාපනය කරන ලද සමාගමක් වන අතර ව්‍යාපාර කටයුතු වශයෙන් තේ වගා කළමණාකරණය, තේ කර්මාන්තශාලා පවත්වාගෙන යාම, තේ වැවිලි සඳහා පොහොර සැපයීම, තේ අපනයනය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන කටයුතු පවත්වාගෙන ගොස් ඇත.

මෙම සමාගම 1971 අංක 35 දරණ ව්‍යාපාර ආයතන රජයට පවරාගැනීමේ පනතට අනුව ගැසට් නිවේදනයක් මගින් 1976 ජනවාරි මස 14 දින ප්‍රථම වතාවට ශ්‍රී ලංකා රජයට පවරාගෙන ඇති අතර එතැන් සිට රජයට පවරා ගත් සීමාසහිත කොළඹ කොමර්ෂල් (පොහොර) සමාගම නමින් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන ලදි.

පසුව රාජ්‍ය සංස්ථා හෝ රජයට පවරාගත් ව්‍යාපාර ආයතන රාජ්‍ය සමාගම් බවට පත්කිරීමේ 1987 අංක 23 දරණ පනත අනුව රුපියල් මිලියන 100 ක (කොටසක් රු. 10 ක් වූ කොටස් මිලියන 10) කොටස් ප්‍රාග්ධනයක් සහිතව සහ එම සම්පූර්ණ කොටස්වල අයිතිය මහාභාණ්ඩාගාර ලේකම් යටතේ වූ සමාගමක් ලෙස 1989 ඔක්තෝම්බර් මස 04 දින ලියාපදිංචි කොට ඇත.

එවකට රජයේ ප්‍රතිපත්තියට අනුව මෙම සමාගම 1994 ජුලි මස 29 පෞද්ගලික කරණයට පත් කරන ලදුව එතැන් සිට 1997 ජනවාරි 20 දින දක්වා පෞද්ගලික කළමණාකාරිත්වය යටතේ පැවතුණි. අනතුරුව 1996 අංක 29 දරණ රාජ්‍ය ආයතන පුනුරුත්ථාපනය කිරීමේ පනත යටතේ 1997 ජනවාරි මස 20 දින නැවත රජයට පවරාගන්නා ලදි. දැනට සමාගමේ කොටස් සම්පූර්ණයෙන්ම මහා භාණ්ඩාගාරයේ ලේකම් සතු වන අතර ගිණුම් කාලපරිච්ඡේදයේදි කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය යටතේ පාලනය විය. මෙම කාලපරිච්ඡේදයේදි නිසිබලධාරි ක්‍රමය වෙනුවට 2011 ජුනි මස 10 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්වීම විශේෂයෙන් සඳහන් කළ යුතුය.

➢ **සමාගම් නාමය**	කොළඹ කොමර්ෂල් පොහොර සමාගම	
➢ **සමාගම ලියාපදිංචි අංකය**	පී බී 1631	
➢ **සංස්ථාපිත දිනය**	1989 ඔක්තෝබර් 04.	
➢ **ලියාපදිංචි කාර්යාලය හා ගබඩා සංකීර්ණය**	දළුපිටිය පාර, හුණුපිටිය, වත්තල.	
➢ **සභාපති**	නීතිඥ.එන්.එස්.එම්.සම්සුදීන් මහතා	
➢ **බැංකුකරුවෝ**	1. මහජන බැංකුව	- ආයතනික ශාඛාව
	2. මහජන බැංකුව	- වත්තල
	3. ලංකා බැංකුව	- වත්තල
➢ **විගණකවරු**	විගණකාධිපති.	

සභාපතිතුමාගේ සමාලෝචනය

කොළඹ කොමර්ෂල් පොහොර සමාගම ලංකාවේ (ශ්‍රී ලංකාව) තම ව්‍යාපාරික කටයුතු කරගෙන යාම සඳහා 1872 දී මහ බ්‍රිතාන්‍යයේ සංස්ථාපනය කරන ලද බ්‍රිතාන්‍ය ජාතිකයන්ට අයත් සමාගමක්ව පැවතින. එතැන්සිට 1976 දක්වා සියවසකට අධික කාලයක් මෙම සමාගම කළමණාකරණය හා පරිපාලනය කරන ලද්දේ ලන්ඩනයේ සිටි බ්‍රිතාන්‍ය ජාතිකයන්විසිනි.කොළඹ කොමර්ෂල් පොහොර සමාගම් සමූහය සමඟ මෙම සමාගම 1971 අංක 35 දරණ ව්‍යාපාරික ආයතන පවරා ගැනීමේ පනතේ විධිවිධානයන්ටඅනුව 1976දී ජනසතු කොට රජයට පවරාගත් සීමාසහිත කොළඹ කොමර්ෂල් (පොහොර)සමාගම’ලෙස තම ව්‍යාපාරික කටයුතු කරගෙන ගිය අතර රජය විසින් පත්කරන්නටයෙදුණු නිසි බලධාරිවරයෙකු යටතේ කළමණාකරනය හා පරිපාලනයවිය.

1989 දී මෙම රාජ්‍ය ව්‍යාපාරය‘සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම’ නමින් රුපියල් මිලියන 100ක අනුදත් හා ගෙවානිම් කොටස් ප්‍රාග්ධනයක් සහිතව සහ එම සම්පූර්ණ කොටස්වල අයිතිය මහාභාණ්ඩාගාරයේ ලේකම් නමින් සංස්ථාගත කරන ලද්දේ 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට පවරා ගත් ව්‍යාපාරික ආයතන පොදු සමාගම් බවට පත්කිරීමේ පනතේ විධි විධානයන්ට අනුවයි.

ඔවකට පැවැත රජයේ ‘විවෘත ආර්ථික ප්‍රතිපත්ති’ අනුව අනෙක් බොහෝ රාජ්‍ය සමාගම් මෙන් මෙම ආයතනය ද පෞද්ගලික කරණයට පත්කෙරිණි. මේ අනුව 1994දී සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ කොටස්වලින් 90% ක් පෞද්ගලික අංශයට පවරන ලදි.ඉතිරි කොටස්10% ක ප්‍රමානය සේවකයන් අතරේ බෙදාදීම සඳහා රඳවා ගන්නා ලදි.

කළමණාකරණයේ ගැටළු හා පසුව ඇතිවූ සේවක නොසන්සුන්තාව හේතුවෙන් ව්‍යාපාරික කටයුතු අකර්මන්‍යවී ආයතනය 1997 දක්වා වූ වසර දෙකක කාලපරිච්ඡේදයක් තුළ වසා තබන ලදි.කෙසේ වෙතත් සේවකයින්ගේ කරුණු දැක්වීම් හේතුවෙන් 1996 අංක 29 දරන රාජ්‍ය ව්‍යාපාර පුනරුත්ථාපනය කිරීමේ පනතේ විධිවිධානයන්ට අනුව 1997 දී නැවත වතාවක් රජයට පවරාගෙන‘සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම’නමින් 2011 දක්වා නිසි බලධාරීවරයෙකු යටතේ කළමණාකරණය හා පරිපාලනය ගෙනයන ලදි.මෙම ගිණුම් කාලපරිච්ඡේදය (එනම් 2011-04-01 - 2012-03-31) තුළට ගැනෙන 2011 ජුනි 10 දින සිට අධ්‍යක්ෂමණ්ඩලයක් පත්කරන්නට යෙදුණු අතර දැනට මෙම සමාගම 2007 අංක07 දරන සමාගම් පනතට අනුව රසායනික පොහොර ආනයනයකර බෙදාහැරීම සඳහා නැවත ලියාපදිංචිකොට ඇත.

'මහින්ද චින්තන' වැඩපිළිවෙල යටතේ ශ්‍රී ලංකාවේ වී වගා අවශ්‍යතාවයෙන් 35% කට සහනාධාර පොහොර බෙදාහැරීමේ නියැලී සිටි අප සමාගම අදාල ගිණුම් කාලපරිච්ඡේදයේදී ළඟා කරගත් තවත් ඉලක්කයක්වනුයේ 2011-06-21 දින සිට අනෙකුත් භෝග වගා සඳහා ද සහනාධාර පොහොර බෙදාහැරීම ආරම්භ කිරීමයි. මේ සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අනුග්‍රහය සහ උපදෙස් ලැබුණු අතර අපගේ මධ්‍යම ගබඩා සංකීර්ණය හා ප්‍රාදේශීය ගබඩා 17 මඟින් එම පොහොර බෙදාහැරීමට පියවර ගෙන ඇත.

ඒ අනුව අදාල වර්ෂයේදී වී සහ අනෙකුත් භෝග සඳහා පොහොර මෙ.ටො. 148000 ක් බෙදා හරින ලදි. අපගේ බදු පසු ශුද්ධ ලාභය ලෙස රුපියල් මිලියන 161 ක් ඉපයීමට හැකිවූ , රුපියල් මිලියන 982 ක පිරිවැටුමක් වාර්ථා විය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත රුපියල් මිලියන 100 ක ආදායම් බද්දක් ගෙවීමට සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමට හැකිවිය. එසේම ලාභාංශ ලෙෂ රුපියල් මිලියන 10 ක් ඒකාබද්ධ අරමුදල වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කිරීම මාගේ භාග්‍යයක් කොට සලකමි.

'දැයටකිරුළ 2011' ට සමගාමීව රුපියල් මිලියන 13 ක වියදමින් අනුරාධපුර දිස්ත්‍රික්කයෙ මිහින්තලේ සීප්පුකුලමෙහි අංග සම්පූර්ණ ගබඩාවක් ඉදිකිරීමට අපට හැකිවිණ.මෙම කාල පරිච්ඡේදයේදී සිදු කරන ලද අනෙකුත් සංවර්ධන කාර්යන් අතර රුපියල් මිලියන 06 ක වියදමින් ප්‍රධාන ගබඩා සංකීර්ණයේ ලොරි රථ අංගනයෙහි නවීකරන කටයුතු සඳහා ටෙන්ඩර් පිරිනැමීමද රුපියල් මිලියන 44 ක් වැයවන මහල් තුනකින් සමන්විත ප්‍රධාන කාර්යාලය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම පිණිස ටෙන්ඩර් කැඳවීම ද සඳහන් කළ හැකි අතර මෙය ලියන අවස්ථාව වනවිට එම කටයුතු බොහෝ දුරට නිමවෙමින් පවතින බව සතුටින් සඳහන් කරමි.

තමම අරමුණු ඉටුකර ගැනීමට සහයෝගය හා දායකත්වය සැපයූ අධ්‍යක්ෂක මණ්ඩලයට , ජ්‍යේෂ්ඨ කළමණාකරුවන්ට, විධායක නිළධාරීන්ට, ලිපිකරු හා අදාල ශ්‍රේණි කාර්ය මණ්ඩලයට හා අනෙකුත් සේවකභවතුන් ඇතුළු සියළු දෙනාටම මාගේ කෘතඥතාවය හිමිවිය යුතුය.

විශේෂයෙන් ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂකතුමා හා කාර්ය මණ්ඩලය විසින් ආනයන සැලසුම් කිරීම තුළින් හිඟයකින් හෝ දෝෂ දර්ශනයට ලක් වීමෙන් තොර සුමට බොදාහැරීමක් සඳහා නොකඩවා දෙන ලද උපදෙස් ද දක්වන ලද අනුග්‍රහය හා සහයෝගය ද සඳහා ස්තුති වන්ත වෙමි. නියමිත දිනට ආනයන බිල්පත් පියවීම පිණිස සහාය වූ භාණ්ඩාගාරය මහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් හා එතුමාගේ කාර්ය මණ්ඩලයටද මාගේ ස්තුතිය නිතැතින්ම හිමිවෙයි. මෙම මූල්‍ය හා මූර්ත

ප්‍රගතිය වෙනුවෙන් දායකවූ සෑම සියළු දෙනාටම මාගේ ස්තූතිය හිමි විය යුතු බව තවදුරටත් සඳහන් කරමි.

ශ්‍රී ලාංකික ගොවි ජනතාවගේ හා එමඟින් සමස්ථ ලක්වාසී ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ සේවා සැපයීමේදී අවශ්‍ය උපදෙස් හා සහයෝගය දැක්වූ ගරු ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාට හා එම අමාත්‍යංශයේ ලේකම්තුමා ඇතුළු සියළුම නිළධාරීන්ට මාගේ ප්‍රශංසාව හිමි වන බව මෙහිලා සඳහන්කරමි.

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොරසමාගම

....
නීතීඥ එන්.එස්.එම්.සම්සුදීන්

සභාපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No. } ඒපීඑෆ්/ජී/සීසීඑෆ්/එෆ්ජී/2011/12 ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2013 මාර්තු [illegible] දින

සභාපති,

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම.

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ 2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව.

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ 2012 මාර්තු 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සමාගමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දැක්වෙන කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයාගැනීමට ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. } 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk

1.4 මතය ව්‍යාවතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2.5 (අ) ඡේදයේ දක්වා ඇති කරුණෙහි ප්‍රතිඵලයක් ලෙස ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංග වලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකිය.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය ව්‍යාවතය

මෙම වාර්තාවේ 2.2.5 (අ) ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණ හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාගමේ බොල්ණය ප්‍රතිපත්තිය අනුව වර්ෂ 05 ට වැඩි ණය සඳහා 2.5% ක ප්‍රතිපාදන සැලසිය යුතු වුවත් රු.36,428,942 ක් හෙවත් මුල් ණය ශේෂයෙන් 63.7% ක් වූ වර්ෂ 05 ඉක්මවූ ණයගැති ශේෂ සඳහා ප්‍රමාණවත් ලෙස බොල්ණය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ). තොග ආනයනය කළ දිනට පැවති විනිමය අනුපාතයට වඩා වෙනස් අනුපාතයකට අවසාන තොගය අගය කිරීම නිසා තොග වටිනාකම රු.10,173,988 කින් වැඩියෙන් දැක්වුණි.

(ආ). අවසාන තොගය මත සහනාධාරය රු.517,005,334 ක් වැඩියෙන් දැක්වීම නිවැරදි කිරීමේදී පොහොර සහනාධාර ගිණුමට බැර කිරීම වෙනුවට විනිමය අලාභය ගිණුමට බැර කිරීම හේතුවෙන් අදාල ගිණුම් එම ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් දැක්වුණි.

(ඈ). සමාලෝචිත වර්ෂය තුල ආනයන බිල්පත් පියවීමේදී, පොහොර ආනයන ගිණුමෙහි ආනයනය කළ පොහොර වටිනාකම වෙනුවට ආනයන බිල්පත් පියවූ දිනවල වටිනාකම දැක්වීම නිසා විනිමය අනුපාතය වෙනස් වීම මත ඇති වූ රු.154,840,852 ක විනිමය අලාභය මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් නොකෙරුණි.

(ඇ). 2007 වර්ෂයේදී ණය පදනම මත පුද්ගලික සමාගමකින් ලබාගත් රු.7,269,820 ක් වටිනා පොහොර තොගයක් සමාලෝචිත වර්ෂයේ පොහොර මිලදී ගැනීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ). 2011 මැයි සිට 2012 පෙබරවාරි දක්වා කාලය තුල දිගුකාලීන ණය සඳහා බැංකුව විසින් අයකළ පොලී සහ දඩ මුදලට වඩා රු.1,237,639 ක් වැඩියෙන් භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කරවාගෙන තිබුණු අතර මෙම මුදල ආදායමක් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

ණයගැති ලෙජරයේ ශේෂයන් සහ ශේෂ සනාථ කිරීම් අතර එකඟ නොවීම් අවස්ථා 28 ක් නිරීක්ෂණය වූ අතර ඉන් අවස්ථා 23 කට අදාල රු.14,611,538 ක් වූ ණය ශේෂ, ණයගැතියන්ගේ පොත් පත් අනුව ශුන්‍ය ශේෂයන් බව ඔවුන් විසින් දන්වා තිබීම හේතුවෙන් එම ණය ශේෂයන්හි නිවැරදිතාව සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමට පත්වීමට නොහැකි විය.

2.2.4 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්

නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ). 2012 මාර්තු 31 දිනට ණයගැතියන් 150 දෙනෙකුට අදාල හිඟ ණය ශේෂය රු.45,877,587 ක් වූ අතර එහි ඇතුළත් 1994 ට පෙර සිට පැවත එන රු.23,803,076 ක ශේෂය අයකර ගැනීම හෝ කපා හැරීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ආ). 1997 වර්ෂයේ පොහොර සමාගම නැවත ආරම්භ කිරීමෙන් පසුව බිහිවූ වසර 07 කට වැඩි ණයගැතියන් 74 දෙනෙකුගෙන් රු.12,625,866 ක් අයවීමට තිබූ නමුත් රු.5,833,063 ක් වූ ණයගැතියන් 06 ක් සම්බන්ධයෙන් පමණක් ණය අයකර ගැනීමේ නීතිමය කටයුතු සිදුකර තිබුණි.

(ඇ). සේවක ණය ශේෂය තුළ වූ වසර 18 කට වඩා පැරණි සේවය හැරගිය, සේවය අත්හිටවනු ලැබූ හා වැඩ තහනමට ලක්වූ සේවකයන්ගෙන් අයකරගත යුතු ණය ශේෂය රු.3,546,999 ක් විය.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

විෂයය	වටිනාකම	ඉදිරිපත් නොකළ සාක්ෂි
	රු.	
(අ). පොහොර තොග	3,282,865,947	භෞතික තොග සත්‍යාපණ වාර්තා
(ආ). ඉඩම්	90,000,000	ඔප්පු හෝ නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීම සඳහා අවශ්‍ය වෙනත් ලියකියවිලි

2.2.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

නීති,රීති යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ). රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ	
i). 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 9.3.1 ඡේදය	සමාලෝචිත වර්ෂයේදී අනුමත බඳවා ගැනීමේ පටිපාටියකින් තොරව බඳවා ගැනීම් 15 ක් සිදුකර තිබුණි.
ii). 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 1.5 ඡේදය සහ 2011 සැප්තැම්බර් 15 දිනැති අංක 58(2) දරන චක්‍රලේඛයේ 8.3.5 ඡේදය	- නිල වාහන සඳහා හිමිකම් නොමැති වැඩ කළමනාකරුට හා ප්‍රවාහන කළමනාකරුට පෞද්ගලික වාහන රාජකාරි කටයුතු සඳහා යොදා ගැනීම වෙනුවෙන් රු.35,000 ක මාසික දීමනාවක් ලබාදී තිබුණි. - කාර්යාලය හා නිවස අතර ප්‍රවාහනය සඳහා නිල ප්‍රවාහන පහසුකම් හිමිකම නොමැති නිලධාරීන් 06 දෙනෙකුට ද කාරයාලයේ සිට නිවෙස බලා යාමට

හා ජීමට පහසුකම් සලසා තිබූ අතර එම වාහන අදාල නිලධාරීන් විසින්ම පදවාගෙන යනු ලබන බව නිරීක්ෂණය විය.

iii). 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන චක්‍රලේඛයේ 8.3.3 ඡේදය	භාණ්ඩාගාරය විසින් අනුමත කල දිරිදීමනා යෝජනා ක්‍රමයක් නොමැතිව දිරිදීමනා වශයෙන් 2011/12 වර්ෂයේදී රු.8,178,899 ක් ගෙවා තිබුණි.
(ආ). 2000 ජුනි 27 දිනැති අංක:පීඑෆ්/පීඊ/9 දරන රාජ්‍ය මුදල් හා 2000 මැයි 02 දිනැති අංක:බීඩී/පීඊ/3/2000 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තු චක්‍රලේඛ	රාජ්‍ය සමාගම්වල මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට පෙර අදාල අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගතයුතු වුවත් එසේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පතුවල රු.464,694,252 ක් ආයෝජනය කර තිබුණි.
(ඇ) 2009 ඔක්තෝබර් 30 දිනැති අංක 4/5/1 දරන ජාතික පොහොර ලේකම් කාර්යාල චක්‍රලේඛය	සහනාධාර පොහොර ණය පදනම මත අලෙවි කල නොහැකි නමුත් ඊට පටහැනි ලෙස 2011 නොවැම්බර් 24 දින රු.282,960 ක් වූ පොල් පොහොර පුද්ගලයකුට ණයට ලබාදී තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේදී සමාගමේ මෙහෙයුම්වලින් රු.264,859,852 ක බදු පෙර ශුද්ධ ලාභයක්වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු.326,513,860 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.61,654,008 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

සමාගමේ විකුණුම් සහ අනෙකුත් ආදායම් 13% කින් පහත වැටීම මූල්‍ය ප්‍රතිඵලයේ අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ). සමාගම විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රාදේශීය ගබඩා ගණන 16 ක් වූ අතර ගබඩා 11 ක් පරිහරණය සම්බන්ධයෙන් ඒවායේ හිමිකරුවන් සමඟ ලිඛිත ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(ආ). 2011/12 වර්ෂය වෙනුවෙන් ගබඩා රක්ෂණය සඳහා රු.1,302,266 ක රක්ෂණ වාරිකයක් ගෙවා තිබුණ ද රක්ෂණ සමාගම විසින් පෙන්වා දී තිබුණු ගබඩාවන්හි පවත්නා අඩුපාඩු පිළිසකර කර නොමැති බැවින් වර්ෂය තුළ සිදු වූ රු.455,621 ක තොග හානි සම්බන්ධයෙන් රක්ෂණ වන්දි අයකරගත නොහැකි වී තිබුණි.

(ඇ). 2009/10 වර්ෂයේ ආදායම් අඩුවෙන් පෙන්වීම ගැලපීම මත වැඩිපුර ගෙවිය යුතු වූ රු.262,257,930 ක බදු මුදල වෙනුවෙන් නව ආදායම් බදු තක්සේරුව යාවත්කාලීන කර එම ප්‍රමාණය දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඈ). කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් වාහන 4 ක් වර්ෂ 10 කටත් වැඩි කාලයක සිට පොහොර සමාගම වෙත ලබාදී ඇති බව නිරීක්ෂණය වූ අතර එම වාහන නිසි පරිදි පවරාදී නොමැති හෙයින් ආයතනයේ වත්කම් ලෙස හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සමාගම සතුව සහනාධාර පොහොර ආනයනයේ හා තොග පවත්වාගෙන යාමේ ක්‍රමවත් සැලැස්මක් නොතිබුණු අතර එක් එක් කන්නයේ පොහොර අවශ්‍යතාව මත පදනම් කරගත් අවම තොග මට්ටම්, උපරිම තොග මට්ටම් හා යලි ඇනවුම් මට්ටම් නිර්ණය නොකර පොහොර ආනයනය කිරීම හේතුවෙන් එක් එක් කන්නයක් අවසානයේදී ප්‍රධාන පොහොර ගබඩාවල අතිරික්ත පොහොර තොග පැවතුනි. උදාහරණ ලෙස 2010 හා 2011 වර්ෂවල එක් එක් කන්නයක් අවසානයේ ප්‍රධාන ගබඩාවල පවතින තොගය ඊළඟ කන්නයේ අවශ්‍යතාවයෙන් දළ වශයෙන් යූරියා 37% ක්, එම්.ඕ.පී. 78% ක්, ටී.එස්.පී. 46% ක් ලෙස නිරීක්ෂණය විය.

4.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

දිනකට මෙට්‍රික් ටොන් 480 ක ධාරිතාවයකින් පොහොර මිශ්‍ර කර නිෂ්පාදන කටයුතු කළ හැකි වටිනාකම රු.3,750,000 ක් වූ පොහොර මිශ්‍රණ යන්ත්‍ර 3 ක් ගබඩා සංකීර්ණයේ ස්ථානගතව පැවති අතර 2008 වර්ෂයෙන් පසුව මෙම යන්ත්‍ර 03 ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

4.4 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයට පටහැනිව සමාගමේ කාර්ය මණ්ඩලය සඳහා බඳවාගෙන තිබූ සාමාජිකයන් 03 දෙනෙකු රේබීය අමාත්‍යාංශයේ සේවය සඳහා යොදවා තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ වැටුප් හා වේතන ලෙස රු.757,862 ක වියදමක් දරා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනයන්

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාර ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් තුල මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කලයුතු වුවත් 2011/2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 5 දින 20 ක ප්‍රමාදයකින් පසුව 2012 නොවැම්බර් 21 දින විගණනය සඳහා ඉදිරිපත්කර තිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂනය වූ අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

(අ). පොහොර තොග පාලනය හා බෙදාහැරීම.

(ආ). වාහන පරිපාලනය.

(ඇ). ණයගැතියන්ගේ හිඟ ණය ශේෂ අයකර ගැනීම.

(ඇ). කොන්ත්‍රාත් පරිපාලනය.

යූ.ජී.එස්. විජේසිංහ

වැඩබලන විගණකාධිපති

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම.

2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

2012 මාර්තු 31 වන දිනට ශේෂ පත්‍රය

	සටහන්	2011/12	2010/11 (සංශෝධිත)
වත්කම්		රු.	රු.
ජංගම නොවන වත්කම්			
2007-03-31 ප්‍රත්‍යාගණිත අගය හා එකතු කිරීම්	1	208,807,360	209,886,592
නොනිමි වැඩ		12,153,192	413,001
		220,960,552	**210,299,594**
ජංගම වත්කම්			
තොගය	2	3,618,217,941	2,724,807,244
වෙළඳ ණයගැතියෝ	3	57,192,064	60,939,307
සේවක ණය හා අත්තිකාරම්		18,908,765	4,480,676
වෙනත් ණයගැතියෝ	4	9,623,253,668	12,952,130,700
අයවිය යුතු බදු		2,394,734	2,675,239
තැන්පතු		452,109	407,109
ස්ථාවර තැන්පතු	5	677,694,252	801,672,463
බැංකුවේ සහ අතැති මුදල්	6	83,093,770	150,797,182
		14,081,207,302	**16,697,909,919**
මුළු වත්කම්		**14,302,167,853**	**16,908,209,512**
හිමිකම් හා වගකීම්			
ප්‍රාග්ධනය හා සංචිත			
කොටස් ප්‍රාග්ධනය (රු:10/-)		100,000,000	100,000,000
ප්‍රාග්ධන සංචිත		1,683,685	1,683,685
අයහාර සංචිත		30,691,298	30,691,298
පිළිසකරණ හා ප්‍රත්‍යාගණන සංචිත		290,172,577	290,172,577
සමුච්චිත ලාභ		922,772,774	768,443,422
		1,345,320,333	**1,190,990,981**
ජංගම නොවන වගකීම්			
දිගු කාලීන ණය		-	**4,668,437,069**
ජංගම වගකීම්			
කෙටි කාලීන ණය		3,586,937,069	3,244,500,000
වෙන් කිරීම්	7	3,481,592,566	2,543,546,413
ව්‍යවස්ථාපිත හා වෙනත් වගකීම්	8	1,958,922	3,879,127
ආපසු ගෙවිය යුතු තැන්පතු		9,750,956	5,891,050
ගනුදෙනුකරුවන්ගේ තැන්පතු හා ලද අතිරික්ත		10,634,395	17,685,271
වෙනත් ජංගම වගකීම්	9	5,553,231,195	4,826,474,019
ගෙවිය යුතු ආදායම් බදු		290,908,448	384,560,006
උපචිත වියදම්		21,833,969	22,245,577
		12,956,847,520	**11,048,781,462**
මුළු හිමිකම හා වගකීම්		**14,302,167,853**	**16,908,209,512**

2007 අංක 07 දරණ සමාගම් පනතෙහි අවශ්‍යතා වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බැව් සහතික කරමි.

එච්.එන්.ආරියදාස
මුදල් කළමණාකරු

මෙම මූල්‍ය ප්‍රකාශ පළකර ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි. අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අත්සන් කළේ.

එන්.එස්.එම්.සම්සුදීන්
සභාපති

ජේ.පී.ප්‍රියංගනී ලියනගේ
අධ්‍යක්ෂ

2012 නොවැම්බර් 20 දින කොළඹ දී ය.

අංක 18 සිට අංක 32 දක්වා පිටුවල පෙන්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වශයෙන් සැලකිය යුතුය

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම

2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

ආදායම් ප්‍රකාශය

	සටහන්	2011/12 රු.	2010/11 රු. (සංශෝධිත)
ආදායම	10	982,118,071	1,070,227,931
විකුණුම් පිරිවැය	11	(655,542,628)	(760,931,218)
දළ ලාභය		**326,575,442**	**309,296,713**
වෙනත් ආදායම්	12	89,726,189	164,561,950
		416,301,631	**473,858,663**
බෙදාහැරීමේ වියදම්	13	(36,387,233)	(17,118,229)
පරිපාලන වියදම්	14	(73,359,044)	(60,127,424)
වෙනත් වියදම්	15	(1,937,512)	(2,489,898)
මූල්‍ය පිරිවැය	16	(39,757,989)	(67,609,253)
බදු පෙර ශුද්ධ ලාභය		**264,859,852**	**326,513,860**
ආදායම් බදු සඳහා වෙන් කිරීම		(104,076,773)	(115,883,449)
බදු පසු ශුද්ධ ලාභය		**160,783,079**	**210,630,411**

අංක 18 සිට අංක 32 දක්වා පිටුවල පෙන්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වශයෙන් සැලකිය යුතුය.

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම.

2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

2012 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීමේ ප්‍රකාශය

	කොටස් ප්‍රාග්ධනය රු.	ප්‍රාග්ධන සංචිත රු.	අයභාර සංචිත රු.	පිළිසකරණ හා ප්‍රත්‍යාගණන සංචිත රු.	සමුච්චිත ලාභය රු.	එකතුව රු.
2010-03-31 දිනට ශේෂය	100,000,000	1,683,685	30,691,298	290,172,577	566,497,639	989,045,198
පෙර වර්ෂය සඳහා ගැලපීම්	-	-	-	-	(8,684,628)	(8,684,628)
කාලච්ඡේදයේ ශුද්ධ ලාභය/ අලාභය	-	-	-	-	210,630,411	210,630,411
ලාභාංශ	-	-	-	-	-	-
2011-03-31 දිනට ශේෂය	100,000,000	1,683,685	30,691,298	290,172,577	768,443,422	1,190,990,981
පෙර වර්ෂය සඳහා ගැලපීම්	-	-	-	-	3,546,273	3,546,273
කාලච්ඡේදයේ ශුද්ධ ලාභය/ අලාභය	-	-	-	-	160,783,079	160,783,079
ලාභාංශ	-	-	-	-	(10,000,000)	(10,000,000)
2012-03-31 දිනට ශේෂය	**100,000,000**	**1,683,685**	**30,691,298**	**290,172,577**	**922,772,774**	**1,345,320,333**

අංක 18 සිට අංක 32 දක්වා පිටුවල පෙන්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වශයෙන් සැලකිය යුතුය.

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම.

2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

2012 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2011/12		2010/11
	රු.		රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් මුදල් ගලා ඒම			
බදු වලට පෙර ශුද්ධ ලාභය	264,859,852		326,513,860
පෙර වර්ෂය සඳහා ගැලපීම්	(3,546,273)		8,684,628
	261,313,579		**335,198,488**
ගැලපුම් :			
ක්ෂය	11,981,743		12,800,031
වෙන් කිරීම්: පාරිතෝෂික	2,716,892		2,697,585
අඩමාණ ණය	179,024		858,581
අවසාන තොගයෙහි සහනාධාර	3,453,267,229		2,528,049,308
ස්ථාවර වත්කම් අලෙවිය මත ලාභය			-
පොලී ආදායම්	(59,820,500)		(43,239,738)
ගෙවූ පොලී	38,372,930		2,303,372
විදේශ විනිමය හුවමාරු ලාභ			(101,404,038)
විදේශ විනිමය හුවමාරු අලාභ	192,697,280		-
තොග හානි			2,090,570
පෙර වසරේ අවසාන තොගයෙහි සහනාධාර ඉවත්කිරීම්	(2,528,049,308)		(1,895,207,384)
	1,372,658,869		**844,146,774**
තැන්පතු (වැඩිවීම / අඩුවීම)			-
තොග (වැඩිවීම / අඩුවීම)	(893,410,697)		(652,244,685)
වෙළඳ ණයගැතියෝ (වැඩිවීම / අඩුවීම)	3,747,243		1,430,642
වෙනත් ණයගැතියෝ (වැඩිවීම / අඩුවීම)	3,328,877,032		1,995,799,951
සේවක ණය (වැඩිවීම / අඩුවීම)	(14,428,089)		331,025
ජංගම වගකීම් (වැඩිවීම / අඩුවීම)	(402,706,793)		1,511,487,293
ජංගම අයවිය යුතු බදු (වැඩිවීම / අඩුවීම)	280,505		5,731,428
කෙටි කාලීන ණය (වැඩිවීම / අඩුවීම)			-
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය	**3,395,018,070**		**3,706,682,429**
ගෙවූ පාරිතෝෂික	(67,685)		(835,166)
ගෙවූ පොලී	(38,372,930)		(53,259,774)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**3,356,577,455**	**3,652,587,489**
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් මුදල් ගලා ඒම			
පොලී ලැබීම්	59,820,500		43,239,738
දේපල පිරියත හා උපකරණ මිලට ගැනීමට ගෙවූ මුදල්	(11,142,510)		(28,029,798)
ස්ථාවර වත්කම් අලෙවිය මත ලැබූ මුදල්			-
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**48,677,990**	**15,209,940**
මුල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
දිගු කාලීන ණය (වැඩිවීම)	(3,586,937,069)		(3,244,500,000)
ලාභාංශ ගෙවීම	(10,000,000)		
මුල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		(3,596,937,069)	(3,244,500,000)
සහනාධාර ගැලපීම්			104,211,968
කාලච්ඡේදයේ මුදල් හා මුදල් වලට සමාන දෑ		**(191,681,623)**	**527,509,396**
කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් වලට සමාන දෑ		952,469,645	424,960,249
කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් වලට සමාන දෑ		**760,788,022**	**952,469,645**

අංක 18 සිට අංක 32 දක්වා පිටුවල පෙන්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වශයෙන් සැළකිය යුතුය.

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම.

ගිණුම්කරණ ප්‍රතිපත්ති.

1. සංස්ථා තොරතුරු

1.1 පදිංචිය හා නීතිමය රාමුව.

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සහ 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සීමාසහිත පොදු සමාගමක් වන අතර ලියාපදිංචි කාර්යාලය වත්තල හුණුපිටිය ප්‍රදේශයේ පිහිටුවා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ එහි ස්වභාවය.

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ පොහොර ආනයනය කිරීම, දේශිය පොහොර මිලදී ගැනිම, පොහොර මිශ්‍ර කිරීම, ඇසුරුම් කිරීම හා රට වටා බෙදා හැරීමය.

1.3 කාර්ය මණ්ඩලය.

මූල්‍ය වර්ෂය අවසානයේදී සමාගමේ කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදිය.

- විධායක කාර්ය මණ්ඩලය - 22
- ලිපිකාර හා සමාන්තර කාර්ය මණ්ඩලය - 93
- කම්කරුවන් - 13

2. ගිණුම්කරණ ප්‍රතිපත්ති.

2.1 පොදු.

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලබන්නේ, පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලටත් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයෙන් දක්වා ඇති ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතින්ටත් අනුකූලව ඓතිහාසික පිරිවැය පදනමක් අනුරූපි වන පරිදි අදාල කරගැනිමෙනි.

කාලපරිච්ඡේදය තුල මූල්‍ය ප්‍රකාශය හා සම්බන්ධ වූ සියළු ආදායම් හා වියදම් වාර්තා ගත කර ඇති අතර, අනුගමනය කරන ලද අදාළ ප්‍රමිත සටහන් තුළින් පැහැදිලි කර ඇත.

2.2 ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්.

මූල්‍ය ප්‍රකාශන තුල ශේෂ පත්‍ර දිනට පසු සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බලා අදාල තැන්හි අවශ්‍ය සංශෝධනයන් කර ඇත.

2.3 ණය ගැනුම් පිරිවැය.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20 - ණය ගැනුම් පිරිවැයට අනුව, අදාල කාලපරිච්චේදය තුල සියළු ණය ගැනුම් පිරිවැයන් වියදම් ලෙස හදුනා ගන්නා ලදි.

2.4 වත්කම් සහ ඒවා අගය කිරීම.

ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම්, මුදල් හා බැංකු ශේෂය හා සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියා චක්‍රය තුල හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වර්ෂයක් තුල යන දෙකෙන් වඩා කෙටි වූ කාලසීමාව තුල යන දෙකෙන් වඩා කෙටි වූ කාලසීමාව තුල මුදල් බවට පත්කර ගැනීමට බලාපොරොත්තු වන දේවල් වේ.

2.4.1 දේපළ, පිරියත හා උපකරණ.

දේපළ, පිරියත හා උපකරණ දක්වනු ලබන්නේ මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ හෝ ප්‍රත්‍යාගණන පිරිවැය හා ඒ සඳහා වූ කිසියම් අනුශාංගික වියදම් වේ නම් ඒවාත් සමගය. වත්කම් දක්වනු ලබන්නේ මෙහි පහත 2.4.2 හි විශේෂිත කොට ඇති පදනම මත පිරිවැයෙන් සමුච්චිත ක්ෂය වීම් අඩුකිරීමෙනි.

2.4.2 ක්ෂය වීම්.

ඉඩම් සඳහා ක්ෂය වීම් කරනු නොලැබේ. අනෙකුත් සියළුම දේපල පිරියත හා උපකරණ සඳහා පිරිවැය කපා හැරීමට සරල රේඛීය පදනම මත ක්ෂය වීම් ප්‍රතිපාදනය කරනු ලැබේ. මේ සඳහා කලින් වර්ෂයට අනුකූල වන පරිදි භාවිත කළ වාර්ෂික අනුපාත මතු දැක්වේ.

ගොඩනැගිලි	5%
කාර්යාලීය උපකරණ	10%
මෝටර් රථ වාහන	20%
පිරියත හා යන්ත්‍ර සහ රසායනාගාර උපකරණ	20%

දේපල පිරියත හා උපකරණ ක්ෂය වීම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 අනුකූල වේ.

2.5 තොග.

තොග පිරිවැය අනුව දක්වනු ලැබේ. පිරිවැය තිරණය කරනු ලබන්නේ ප්‍රථම නිකුතු පදනමට හා අමතර වියදම්වල සිට මිලදී ගැනිම දක්වා වූ සියලූම වියදම්ද ඇතුළත්වය. නිමි භාණ්ඩ සම්බන්ධයේදී සියලූම ඍජු වියදම් හා සාමාන්‍ය කටයුතු මත වන නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ද ඇතුලත් කෙරේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 05 ට අනුකූලවේ.

2.6 ණය ගැතියෝ සහ ලැබිය යුතු දෑ.

බොල් ණය ප්‍රතිපාදනය කර තිබෙනුයේ අවුරුද්දකට වඩා හිඟව තිබෙන ණය ගැතියන්ගෙන් හා අවුරුදු 05 ට අඩු ණයගැතියන්ගෙන් 0.1% ක් ද, අවුරුදු 05 ට වැඩි ණයගැතියන්ගෙන් 2.5% ක් ද වන පරිදිය.

2.7 ආයෝජන.

භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු ආයෝජන, පිරිවැය අනුව දක්වනු ලැබේ. ආයෝජනයන්හි ආදායම උපචිත පදනම මත ගිණුම් ගත කරයි.

2.8 මුදල් හා මුදල්වලට සමාන දෑ.

මුදල් හා මුදල්වලට සමාන දේවල් යන්නෙහි අර්ථ නිරූපණය කළහැක්කේ අතේ ඇති මුදල්, ඉල්ලූම් තැන්පතු හා ලැබෙන මුදල් ප්‍රමාණය දැනගත හැකි ආකාරයෙන් ක්ෂණිකව මුදල් කරගත හැකි වුත් වටිනාකම වෙනස් වීමේ අවදානමට සුළු වශයෙන් පමණක් යටත් වන්නාවුත් කෙටිකාලින ඉහල ද්‍රවශීලතාවෙන් යුත් ආයෝජන යනුවෙනි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා මුදල් හා මුදල්වලට සමාන දේවල් වශයෙන් සලකනු ලබන්නේ අතැති මුදල් හා බැංකුවට ගෙවිය යුතු වන බැංකු අයිරාවලින් ශුද්ධ වු බැංකු තැන්පත්ය. අත්වීමේ දින සිට තුන් මසකදී හෝ ඊට අඩු කලකදී කල්පිරෙන ආයෝජන ද මුදල් හා සමාන වු ලෙස සලකනු ලැබේ. ආයෝජන කටයුතු වලින් ගලා එන මුදල්, වක්‍ර ක්‍රමය උපයෝගි කරගෙන වාර්තා කරනු ලැබේ.

2.9 වගකීම් හා වෙන් කිරීම්.

ශේෂ පත්‍ර දිනය වන විට දන්නා සියළුම වගකීම් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර තිබෙන අතර තිබෙන බව දන්නා නමුත් නිවැරදි ප්‍රමාණය නිශ්චය කළ නොහැකි වූ බැරකම් සඳහා ප්‍රමාණවත් වෙන්කිරීම් කර ඇත.

ඉල්ලූ විට ගෙවීම සඳහා බැඳීමක් හෝ ශේෂ පත්‍ර දින සිට අවුරුද්දක් ඇතුළත ගෙවීම සඳහා බැඳීමක් පවතින්නාවූ වගකීම්, ජංගම වගකීම් ලෙස ශේෂ පත්‍රය තුල වර්ග කර ඇත.

තවද, ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත්තේ ශේෂ පත්‍ර දින සිට අවුරුද්දකට පසු ඉවත් කිරීම සඳහා බැඳීමක් පවතින්නාවූ වගකීම්ය.

2.10 විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය.

(අ) ප්‍රතිලාභ සැලැස්ම / පාරිතෝෂික

සියළුම සේවකයන්ට ගෙවිය යුතු පාරිතෝෂික 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 වන "විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය" අනුව මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන කර ඇත. පාරිතෝෂික ගණනය කිරීම සඳහා යම් සේවකයෙකු සිය සේවාව අවුරුද්දකට වඩා වැඩි කාලයක් තුල අඛණ්ඩව සමාගම වෙත ලබාදී තිබිය යුතුය. පාරිතෝෂික වගකීම බාහිර අරමුදලක් හෝ උපචිත අගයක් නොවන අතර, මෙය විලම්භිත වගකීමක් ලෙස ශේෂ පිරික්සුමේ වර්ගීකරණය කර ඇත.

(ආ) නිශ්චිත දායක මුදල් සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල් වලට හා සේවක භාරකාර අරමුදල් දායක මුදල්වලට සුදුසුකම් ඇති සියළුම සේවකයෝ අදාල ව්‍යවස්ථා හා රෙගුලාසි වලට අනුව එම අරමුදල් වලින් ආවරණය වෙති. සේවායෝජකගේ දායකත්වය නිශ්චිත දායකත්ව සැලසුමක් වන අතර, ආදායම් ප්‍රකාශයේදී එය වියදමක් ලෙස හඳුනාගනු ලබයි.

2.11 ප්‍රදාන හා සහනාධාර.

පොහොර සහනාධාර

නිශ්චිත පොහොර වර්ග ආනයනය කිරීම සඳහා සහනාධාර ගෙවනු ලබන අතර, එම අවස්ථාවලදී උපරිම සිල්ලර මිල නියම කරන්නේ කෘෂිකර්ම අමාත්‍යාංශය මගිනි. සහනාධාර හිමිකම විකුණුම් පිරිවැයට ඇතුලත් කර ඇත.

2.12 බදුකරණය.

ආදායම් බදු.

2006 අංක 10 දරණ ආදායම් බදු පනතේ පරිච්ඡේද අංක **2** ට අනුව සමාගම බදු ගෙවීම සඳහා වගකීමට බැඳී ඇත්තේ බදු අය කල හැකි ආදායමින් **28%** කි.

2.13 ප්‍රාග්ධන වගකීම් හා අසම්භාව්‍ය වගකීම්.

මෙම මූල්‍ය ප්‍රකාශය තුළදී සියළුම ප්‍රාග්ධන වගකීම් හා අසම්භාව්‍ය වගකීම් සඳහා අවශ්‍ය වන්නා වූ ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් ගැනද සැලකිලිමත් වී ඇත.

2.14 පිරිවැටුම.

පිරිවැටුමෙන් නියෝජනය වන ආදායම වන්නේ, භාණ්ඩයන්හි ඉන්වොයිස් අගයයි.

2.15 ආදායම් හඳුනාගැනීම.

ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒමේ හා ආදායම විශ්වාසී අන්දමින් මිනිය හැකි වීමේ ප්‍රමාණයට අනුව ආදායම හඳුනා ගනු ලැබේ. ආදායමක් වශයෙන් පිළිගැනීමට පෙර මතු දැක්වෙන විශේෂිත නිර්ණායකයන් ගැනද සැලකිලිමත් වී ඇත.

(අ) බඩු විකිණීම

භාණ්ඩ විකිණීමෙන් එන ආදායම, ආදායම ලෙස පිළිගනු ලබන්නේ භාණ්ඩවල අයිතිය අවධානමකින් තොරව ගැනුම්කරු වෙත හුවමාරු වූ විටය.

(ආ) පොළිය

පොළී ආදායම එකතු කිරීමේ හැකියාව පිළිබඳ සැකයක් නැත්නම් පොළිය උපචිත ලෙස සලකනු ලැබේ.

2.16 වියදම් හඳුනා ගැනීම.

2.16.1 අයභාර වියදම්.

ආදායම් ප්‍රකාශයේ දක්වා ඇති පරිදි සමාගම උපයාගත් ලාභය වන්නේ සියළුම දන්නා වගකීම් සඳහාත් ක්ෂය වීම් සඳහාත් ප්‍රතිපාදන සැපයීමෙන් පසු ඉතිරි මුදලයි.

2.16.2 ප්‍රාග්ධන වියදම්

ව්‍යාපාරය කරගෙන යාම මගින් ස්ථිර ස්වභාවයේ වත්කම් විස්තිරණය කිරීමේ හෝ වැඩි දියුණු කිරීමේ අරමුණින් හෝ ව්‍යාපාරයේ ඉපයීම් හැකියාව වැඩිකිරීමේ අරමුණින් දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සළකා ඇත.

ස්ථාවර වත්කම් ඉවත් කිරීම මත ආදායම් ස්වභාවයේ ලැබූ ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයේ ගිණුම්ගත කොට ඇත.

2.17 සංන්සන්දනාත්මක අගයන්.

ඇතිවී තිබෙන්නාවූ සංසන්දනාත්මක අගයන් සඳහා අවශ්‍ය තහවුරු කිරීම් වර්තමාන ඉදිරිපත් කිරීමේදි පෙන්වා ඇත.

2.18 විදේශ මුදල් පරිවර්තනය කිරීම.

විදේශ ගනුදෙනුවලින් ලැබෙන මුදල් එම ගනුදෙනුව සිදුවන අවස්ථාවේ පැවති විනිමය අනුපාතය අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 21 ට අනුකූලව විදේශ මුදල් සම්බන්ධව සියලුම මූල්‍ය වත්කම් හා බැරකම්, ශේෂපත්‍ර දිනයෙහි තිබෙන විනිමය අනුපාතිකයට අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. එහිදි ඇතිවන ලාභ හා අලාභ පිළිබඳ ආදායම් ප්‍රකාශයේදි සලකා බලනු ලැබේ. ප්‍රවර්ථන වර්ශයේ සිට විදේශ මුදල් පරිවර්ථනය කිරීමේ වාසි අවාසි විකුණුම් පිරිවැය ආගණනයේදි සලකා බැලේ'

2.19 රාජ්‍ය ප්‍රදාන.

සියළුම රාජ්‍ය ප්‍රදානයන් පොහොර සහනාධාරය තුල ඇතුලත් වන අතර, එය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 ට අනුකූලව ගිණුම් ගත කොට ඇත.

2.20 අසම්භාව්‍ය වත්කම් හා වගකීම්.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 ට අනුකූලව අවශ්‍ය හෙළිදරව් කිරීම් හා ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශය තුල සිදුකොට ඇත.

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම.

2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

සටහන 01

ස්ථාවර වත්කම්

		2011.04.01 ශේෂය	එකතු කිරීම්/ (ඉවත් කිරීම්)	එකතුව	ක්ෂය අනුපාතය	සමුච්චිත ක්ෂය	වසරේ ක්ෂය වීම	ක්ෂය එකතුව	ලියාහළ අගය
		රු.	රු.	රු.		රු.	රු.	රු.	රු.
1	ඉඩම්	90,000,000	-	90,000,000	0.00%	-	-	-	90,000,000
2	ගොඩනැගිලි	116,724,043	-	116,724,043	5.00%	20,546,734	5,836,202	26,382,936	90,341,107
3	පිරියත හා යන්ත්‍ර	15,139,787	391,460	15,531,247	20.00%	11,623,930	328,500	11,952,431	3,578,816
4	මෝටර් රථ	25,080,503	9,996,000 (1,200,000)	33,876,503	20.00%	9,449,062	4,936,201	14,385,262	19,491,241
5	කාර්යාලීය උපකරණ	8,053,344	755,050	8,808,394	10.00%	2,531,359	880,839	3,412,198	5,396,196
	එකතුව	**254,997,678**	**9,942,510**	**264,940,188**		**44,151,085**	**11,981,743**	**56,132,828**	**208,807,360**

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම.

2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

සටහන 02

තොගය

	2011/12 රු.	2010/11 රු.
පොහොර	3,597,872,946	2,708,539,468
වෙන් කිරීම් : තොග හානි සඳහා	(833,670)	-
පොදු ගබඩා තොග අයිතම්	12,180,371	10,939,019
ඇසුරුම් ද්‍රව්‍ය	7,526,984	4,418,008
ලිපි ද්‍රව්‍ය	1,471,309	910,748
එකතුව	**3,618,217,941**	**2,724,807,244**

සටහන 03

වෙළඳ ණයගැතියෝ

	2011/12 රු.	2010/11 රු.
ප්‍රවර්තන වර්ෂය තුළ ණයගැතියෝ	2,555,447	9,757,520
වසර 5 ට අඩු	11,314,758	15,064,715
වසර 5 ට වැඩි	43,321,858	36,117,072
එකතුව	**57,192,064**	**60,939,307**

සටහන 04

වෙනත් ණයගැතියෝ

	2011/12 රු.	2010/11 රු.
අත්තිකාරම් ගෙවීම් සහ කලින් කළ ගෙවීම්	10,950,015	19,439,024
අත්පිට විකුණුම් ණයගැතියෝ	-	328,130
ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලිය	16,894,729	16,414,256
වෙනත් ණයගැතියෝ	18,016	18,016
ලැබිය යුතු සහනාධාර	9,329,236,477	12,810,345,675
ලැබිය යුතු සහනාධාර(අතුරු භෝග)	201,851,275	-
සීමාසහිත ලංකා නැව් සංස්ථාව	1,613,008	-
භාණ්ඩාගාරය වෙතින් ලැබිය යුතු පොලිය	46,169,602	74,319,183
සීමාසහිත ලංකා පොහොර සමාගම	-	7,348,884
සීමාසහිත ඊ.ටී.ඒ. ලංකා :(පෞද්.) සමාගම	-	7,269,820
කොමර්ෂල් පොහොර සුභසාධක සංගමය	20,000	37,500
තැපැල්පති	47,357	21,029
අයවිය යුතු කුලී	47,184	147,959
වාහන අනතුරු අලාභ අයකර ගැනීම	-	42,218
හිඟ හිටි සැපයුම් සඳහා අයකර ගැනීම	16,399,006	16,399,006
වැටුප් අත්තිකාරම්	7,000	-
එකතුව	**9,623,253,668**	**12,952,130,700**

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම.

2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

සටහන 05

භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පත==

බැංකුව	තැන්පතු අංකය	2011/12 මුදල රු.	2010/11 මුදල රු.
භාණ්ඩාගාර බිල්පත්			
මහජන බැංකුව	M11B-002658		100,000,000
මහජන බැංකුව	M11B-000480		25,000,000
මහජන බැංකුව	M11B-000592		30,000,000
මහජන බැංකුව	M11B-001253		75,000,000
මහජන බැංකුව	M11B-001393		135,000,000
මහජන බැංකුව	M11B - 006447	20,000,000	
මහජන බැංකුව	M11B - 017091	45,000,000	
මහජන බැංකුව	M11B - 017159	15,000,000	
මහජන බැංකුව	M11B - 017467	30,000,000	
මහජන බැංකුව	120119	40,000,000	
මහජන බැංකුව	120458	28,000,000	
මහජන බැංකුව	120834	35,000,000	
ස්ථාවර තැන්පතු			
මහජන බැංකුව	004-60-01-00002113-2	16,717,396	15,530,686
මහජන බැංකුව	004-60-01-00001570-0	16,726,942	15,409,436
ලංකා බැංකුව	161820	100,000	100,000
මහජන බැංකුව	222-60-01-00004312-3	74,216	69,925
මහජන බැංකුව	222-60-01-00004618-4	71,712	66,079
මහජන බැංකුව	222-60-01-00005139-1	67,331	62,042
මහජන බැංකුව	222-60-01-00005140-8	67,331	62,042
මහජන බැංකුව	222-60-01-00005141-7	67,331	62,042
මහජන බැංකුව	222-60-01-00005142-6	-	62,042
මහජන බැංකුව	222-60-01-00005144-4	67,331	62,042
මහජන බැංකුව	222-60-01-00005143-5	-	62,042
මහජන බැංකුව	222-60-01-00005145-3	67,331	62,042
මහජන බැංකුව	222-60-01-00005146-2	67,331	62,042
මහජන බැංකුව	004-60-01-00004902-3	107,650,000	100,000,000
මහජන බැංකුව	004-60-01-00004907-8	322,950,000	300,000,000
ආශ්ව¾ය ඉ‍ෑත=රුම්		-	5,000,000
එකතුව		**677,694,252**	**801,672,463**

බැංකුවේ සහ අතැති මුදල්

	2011/12 රු.	2010/11 රු.
මහජන බැංකුව – ආයතනික ශාඛාව : ගිණුම් අංක 004100170211270	24,851,232	35,097,379
මහජන බැංකුව – ආයතනික ශාඛාව : ගිණුම් අංක 004100160204816	47,898,286	(77,233)
මහජන බැංකුව - වත්තල : ගිණුම් අංක 222100160976544	5,971,257	109,322,157
ලංකා බැංකුව - වත්තල : ගිණුම් අංක 135670	2,657,382	4,245,557
අනු එකතුව	**81,378,157**	**148,587,860**
සුළු මුදල්	22,765	21,475
ප්‍රාදේශීය ගබඩා හදිසි අරමුදල	1,692,848	2,187,848
එකතුව	**83,093,770**	**150,797,182**

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම.

2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

සටහන 07

වෙන් කිරීම්

	2011/12 රු.	2010/11 රු.
පාරිතෝෂික සඳහා වෙන් කිරීම	17,240,904	14,591,697
අඩමාණ ණය සඳහා වෙන් කිරීම (0.1%)	1,084,433	905,409
අවසාන තොගයෙහි සහනාධාර	3,261,119,301	2,528,049,308
අවසාන තොගයෙහි සහනාධාර(අතුරු භෝග)	192,147,928	-
ලාභාංශ සඳහා වෙන් කිරීම	10,000,000	-
එකතුව	**3,481,592,566**	**2,543,546,413**

සටහන 08

ව්‍යවස්ථාපිත හා වෙනත් ගෙවීම් පිළබඳ වගකීම්

	2011/12 රු.	2010/11 රු.
උත්සව අත්තිකාරම්	-	500
සේවක භාරකාර අරමුදල	1	-
සේවක අර්ථසාධක අරමුදල	0	1
ගෙවිය යුතු මුද්දර ගාස්තු	5,740	5,265
සුභසාධන සංගම් හා මරණාධාර පරිත්‍යාග	17,750	9,770
ගෙවිය යුතු හිඟ වැටුප්	1,015,461	3,863,561
අවිනිශ්චිත ගිණුම	-	30
වෘත්තීය සමිති සඳහා ගෙවීම	3,360	-
උපයන විට ගෙවිය යුතු බදු	(9,600)	-
ජාතිය ගොඩනැගීමේ ගෙවිය යුතු බදු	241,209	-
සේවක ආරක්ෂණ තැන්පතු	685,000	-
එකතුව	1,958,922	3,879,127

සටහන 09

වෙනත් වගකීම්

	2011/12 රු.	2010/11 රු.
ණයවර ලිපි මත ගෙවිය යුතු බිල්පත්	5,505,817,493	4,275,660,232
අත්පිට විකුණුම් මත නිදහස් කළ යුතු මුදල්	-	501,938
සී/ස ලංකා ලුණු සමාගම	591,880	1,009,677
කෙටිකාලීන ණය	-	474,982,988
ගෙවිය යුතු පොලී - මහා භාණ්ඩාගාරයට	46,169,602	74,319,183
ගෙවිය යුතු විගණන ගාස්තු	300,000	-
සී/ස ලංකා පොහොර සමාගම	352,220	-
එකතුව	**5,553,231,195**	**4,826,474,019**

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම

2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

සටහන 10

පොහොර විකුණුම්

ගබඩා	2011/12 රු.	2010/11 රු.
පොහොර අත්පිට විකුණුම් - සහනාධාර	413,629,805	62,177,520
පොහොර අත්පිට විකුණුම් - සහනාධාර නොවන	417,563	3,374,367
පොහොර ණයට විකුණුම් - ප්‍රධාන කාර්යාලය	29,074,293	337,917,875
පොහොර ණයට විකුණුම් - කුරුණෑගල	28,656,727	36,890,436
පොහොර ණයට විකුණුම් - බදුල්ල	3,981,120	6,753,230
පොහොර ණයට විකුණුම් - කඩුගන්නාව	9,000,585	12,496,187
පොහොර ණයට විකුණුම් - ගලෙන්බිදුණුවැව	42,764,168	39,682,962
පොහොර ණයට විකුණුම් - මාතර	12,969,135	15,198,117
පොහොර ණයට විකුණුම් - කන්තලේ	11,845,746	28,671,082
පොහොර ණයට විකුණුම් - නෑගම	51,224,681	54,974,546
පොහොර ණයට විකුණුම් - මඩකලපුව	-	5,691,917
පොහොර ණයට විකුණුම් - නිකවැරටිය	59,933,171	67,511,565
පොහොර ණයට විකුණුම් - දෙහිඅත්තකණ්ඩිය	47,080,572	61,235,559
පොහොර ණයට විකුණුම් - බුත්තල	13,911,972	13,052,523
පොහොර ණයට විකුණුම් - බටඅත	51,363,673	68,422,310
පොහොර ණයට විකුණුම් - අක්කරෙයිපත්තු	78,318,030	141,527,859
පොහොර ණයට විකුණුම් - සූරියආර	12,708,322	6,723,563
පොහොර ණයට විකුණුම් - සේරුනුවර	16,404,894	-
පොහොර ණයට විකුණුම් - කඳුරුවෙල	14,735,248	17,066,181
පොහොර ණයට විකුණුම් - ජයන්තිපුර	49,067,623	61,274,796
පොහොර ණයට විකුණුම් - පණ්ඩුලගම	26,752,426	29,585,336
පොහොර අත්පිට විකුණුම් (අතුරු භෝග)- ප්‍රධාන කාර්යාලය	6,833,519	-
පොහොර අත්පිට විකුණුම් (අතුරු භෝග)- කුරුණෑගල	720	-
පොහොර අත්පිට විකුණුම් (අතුරු භෝග)- බදුල්ල	-	-
පොහොර අත්පිට විකුණුම් (අතුරු භෝග)- කඩුගන්නාව	70,540	-
ශේෂය ප/ගෙ	**980,744,533**	**1,070,227,931**

ශේෂය ඉ/ගෙ	**980,744,533**	**1,070,227,931**
පොහොර අත්පිට විකුණුම් (අතුරු භෝග)- ගලෙන්බිදුණුවැව	-	-
පොහොර අත්පිට විකුණුම් (අතුරු භෝග)- මාතර	-	-
පොහොර අත්පිට විකුණුම් (අතුරු භෝග)- කන්තලේ	172,620	-
පොහොර අත්පිට විකුණුම් (අතුරු භෝග)- නෑගම	4,200	-
පොහොර අත්පිට විකුණුම් (අතුරු භෝග)- නිකවැරටිය	1,014,020	-
පොහොර අත්පිට විකුණුම් (අතුරු භෝග)- දෙහිඅත්තකණ්ඩිය	42,258	-
පොහොර අත්පිට විකුණුම් (අතුරු භෝග)- බුත්තල	-	-
පොහොර අත්පිට විකුණුම් (අතුරු භෝග)- බටඅත	-	-
පොහොර අත්පිට විකුණුම් (අතුරු භෝග)- අක්කරෙයිපත්තු	-	-
පොහොර අත්පිට විකුණුම් (අතුරු භෝග)- සූරියආර	131,920	-
පොහොර අත්පිට විකුණුම් (අතුරු භෝග)- වීරවිල	-	-
පොහොර අත්පිට විකුණුම් (අතුරු භෝග)- සේරුනුවර	-	-
පොහොර අත්පිට විකුණුම් (අතුරු භෝග)- කදුරුවෙල	8,520	-
පොහොර අත්පිට විකුණුම් (අතුරු භෝග)- ජයන්තිපුර	-	-
පොහොර අත්පිට විකුණුම් (අතුරු භෝග)- පණ්ඩුලගම	-	-
	982,118,071	**1,070,227,931**

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම.

2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

සටහන 11

විකුණුම් පිරිවැය

	සටහන්	2011/12	2010/11 රු.
නිෂ්පාදන පිරිවැය - පොහොර			
2011 අප්‍රේල් 01 තොගය		2,708,539,468	1,904,719,126
එකතු කලා			
මිලදී ගැනුම්		8,704,220,755	8,206,225,763
විනිමය අලාභ		192,697,280	-
ප්‍රවාහන ගාස්තු		86,670,403	91,408,752
		11,692,127,906	10,202,353,641
පොහොර සහනාධාර	17	(11,191,247,257)	(9,568,809,911)
අවසාන තොගයෙහි සහනාධාර		3,453,267,229	2,528,049,308
ව්‍යාපාර පිරිවැටුම් බදු		-	8,535,380
ජාතිය ගොඩනැගීමේ බද්ද		9,819,743	662,084
සමාජ ආරක්ෂණ බද්ද		1,803,452	-
		3,965,771,073	3,170,790,501
අඩු කලා		-	-
2012 මාර්තු 31 තොගය		(3,597,872,946)	(2,708,539,468)
තොග හානි		-	(2,090,570)
පාරිභෝජනය කල පොහොර වල පිරිවැය		**367,898,127**	**460,160,462**
ඇසුරුම් ද්‍රව්‍ය			
2011 අප්‍රේල් 01 තොගය		4,418,008	4,596,140
එකතු කලා			
මිලදී ගැනුම්		3,352,759	-
		7,770,767	4,596,140
අඩු කලා			
2012 මාර්තු 31 තොගය		(7,526,984)	(4,418,008)
පාරිභෝජනය කල ඇසුරුම් ද්‍රව්‍ය වල පිරිවැය		**243,783**	**178,133**
එකතු කලා: ඍජු වේතන		**43,905,155**	**44,187,446**
ප්‍රාදේශීය ගබඩා පිරිවැය		87,820,884	121,995,013.66
ප්‍රවාහන පිරිවැය		121,803,583	101,928,945.52
ප්‍රාථමික පිරිවැය		**621,671,532**	**728,450,000**
එකතු කලා			
සාමාන්‍ය පොදු කාර්ය පිරිවැය			
අමතර කොටස්		1,612,188	3,359,792
කම්හල් පොදු කාර්ය පිරිවැය		30,382,809	27,683,196
රසායනාගාර පොදු කාර්ය පිරිවැය		1,876,100	1,438,230
මුළු පොදු කාර්ය පිරිවැය		**33,871,096**	**32,481,218**
විකුණුම් පිරිවැය		**655,542,628**	**760,931,218**

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම.

2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

සටහන 12

වෙනත් ආදායම්

	2011/12 රු.	2010/11 රු.
පොලී ලැබීම්	59,820,500	43,239,738
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	-	-
කුලී ආදායම	988,194	1,053,308
ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු	493,800	259,000
විවිධ ආදායම්	4,502,115	11,751
කිරීම් ගාස්තු	-	-
අබලි ද්‍රව්‍ය විකුණුම්	617,565	81,472
ඇසුරුම් විකුණුම්	-	-
නියමිත දිනට පෙර නැවෙන් භාණ්ඩ ඉවත් කර ගැනීම සඳහා	21,942,014	18,512,643
විදේශ විනිමය හුවමාරු ලාභ	-	101,404,038
ස්ථාවර වත්කම් විකිණීම	1,362,000	-
අධි අඩමාණ ණය සඳහා වෙන්කිරීම්	-	-
	89,726,189	**164,561,950**

සටහන 13

විකුණුම් හා බෙදා හැරීම් වියදම්

	2011/12 රු.	2010/11 රු.
විකුණුම් ප්‍රවර්ධන	1,596,774	1,224,455
ප්‍රාදේශීය ගබඩා වියදම්	34,611,434	15,035,193
බොල් ණය	179,024	858,581
	36,387,233	**17,118,229**

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම.

2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

සටහන 14

ආයතන හා පරිපාලන වියදම්

	2011/12 රු.	2010/11 රු.
ප්‍රධාන කාර්යාලීය විධායක කාර්ය මණ්ඩල වේතන	11,895,555	10,416,891
ප්‍රධාන කාර්යාලීය ලිපිකාර හා සමාන්තර කාර්ය මණ්ඩල	32,641,685	27,404,436
ප්‍රධාන කාර්යාලීය අනියම් හා පුහුණු කාර්ය මණ්ඩල වේතන	1,372,022	749,137
පාරිතෝෂික	2,716,892	2,697,585
ගොඩනැගිලි නඩත්තු	113,735	9,171
විදුලිය	55,854	40,600
ජල බිල්පත්	33,191	15,586
දුරකථන ගාස්තු	908,748	885,177
ආරක්ෂක ගාස්තු	4,590,421	4,869,006
ලිපි ද්‍රව්‍ය	1,237,634	1228966.185
තැපැල් හා විදුලි	101,592	199070
නීති හා වෘත්තීය ගාස්තු	1,828,301	1250786.5
මෝටර් රථ වාහන නඩත්තු	4,653,327	3831600.28
වාහන කුලී	882,565	356800
වරිපනම් හා බදු	33,439	18552.44
රක්ෂණය	1,356,455	6546.42
කාර්යාලීය උපකරණ නඩත්තුව	744,501	384728.68
ගමන් වියදම්	394,213	89140
විගණන ගාස්තු	548,747	0
වෙනත් පරිපාලන වියදම්	33,744	422396.6
සංග්‍රහ වියදම්	1063992.51	1640629.25
ගොඩනැගිලි ක්ෂය	583,620	540780.81
කාර්යාල උපකරණ ක්ෂය	880,839	747186.54
බලපත්‍ර ගාස්තු	29,333	14424.5
තොග සත්‍යාපන වියදම්	670,954	546901
අධ්‍යක්ෂක දීමනා	1,505,150	0
සමාගම ලියාපදිංචි කිරීමේ වියදම	-	10982.5
නවාතැන් වියදම්	154,159	87240
සේවක පුහුණු වියදම්	50,500	11100
දිවි නැගුම වැඩසටහන සඳහා වියදම්	-	238530
වාහන රක්ෂණය	779,657	439286.93
පොහොර රක්ෂණ වියදම්	-	974185.61
කාර්ය මණ්ඩල සුභසාධනය	296,920	0
පුනිසම්පාදන වියදම්	629,451	0
දැයට කිරුළ වියදම්	571,846	0
	73,359,044	**60,127,424**

සටහන 15

වෙනත් වියදම්

	2011/12 රු.	2010/11 රු.
තොග හානි	833,670	2,090,570
වෙනත් වියදම්	1,103,842	399,328
	1,937,512	**2,489,898**

2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

සටහන 16

මූල්‍ය වියදම්

	2011/12 රු.	2010/11 රු.
බැංකු ගාස්තු	1,385,059	14,333,829
දඩ මුදල්	-	15,649
බැංකු අයිරා පොලී	351,984	478,088
කෙටිකාලීන ණය පොලී	20,479,028	11,260,621
දිගුකාලීන ණය පොලී	(1,237,639)	2,303,372
නොගෙවූ බිල් සඳහා පොලී	18,779,556	39,217,694
	39,757,989	**67,609,253**